ස.සේ.කො.චක්‍රලේඛ අංක : 01/2007(i)

මගේ අංකය : ස.සේ.කො./5/1/iii වෙළම,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2021.03.08

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩල වල,
ගරු සභාපති / සාමාන්‍යාධිකාරී/ කළමනාකරු.

<u>සමුපකාර සමිති සේවකයින්ට වැඩ බැලීමේ වැටුප් ගෙවීම.</u>

උක්ත කරුණට අදාලව මෙම කොමිෂන් සභාව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 1/2007 හා 2007.11.21 දිනැති චක්‍රලේඛයට 2021.02.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත වගන්ති ආදේශ කරනු ලැබේ.

2 : vii වැඩ බැලීමට පත් කරනු ලබන සේවකයා වැඩ බලන තනතුරට අදාල මූලික සුදුසුකම් සපුරා තිබිය යුතුය.

3. තනතුරක රාජකාරි ඉටු කිරීම.

3: i . නිත්‍ය තනතුරක් දරන්නෙකු, පූර්ණ කාලීන නිලධාරියෙකු අවශ්‍ය නොවන තනතුරක වැඩ බැලීමට පත්කරනු ලැබුවහොත් හෝ යම්කිසි තනතුරක "රාජකාරි ඉටු කිරීමට" පත්කරනු ලැබුවහොත් ඔහුට ඒ සඳහා වැටුපක් /පාරිශ්‍රමිකයක් ලැබීමට හිමිකම් නැත.

3: ii . අනුමත පිරිස් බල තක්සේරුව අනුව තනතුරක් පුරප්පාඩු වූ වහාම එම පුරප්පාඩුව පිරවීමට කටයුතු කළ නොහැකි නම්, 2 : ii හා 2 : vii වගන්ති පරිදි වැඩ බලන තනතුරට අදාල මූලික සුදුසුකම් සපුරා ඇති සේවකයෙකු මාස 03 ක උපරිම කාල සීමාවක් දක්වා තනතුරේ වැඩබැලීමට පත්කිරීම සඳහාද එසේ සුදුසුකම් සපුරා ඇති සේවකයෙකු නොමැති අවස්ථාවකදී සේවා අවශ්‍යතාව අනුව එම තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා වඩාත්ම සුදුසු නිලධාරියෙකු පත් කල හැකි අතර, ඒ සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

3: iii. මේ සඳහා වැටුපක්/පරිශ්‍රමිකයක් ගෙවිය නොහැකි අතර එබඳු සේවකයෙකුට ගෙවිය යුත්තෙ
එම තනතුරට වැඩ බැලීමට පත්කරනු ලැබී නම්,ඔහුට ලැබෙන අතිරේක පරිශ්‍රමිකයෙන් තු
දෙකක ප්‍රමාණයකි.

මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්
එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ.හේරත්
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වය

**එච්.එම්.පී.කේ. හේරත්**
**ලේකම්**
**සමුපකාර සේවක කොමිෂන් සභාව**
**වයඹ පළාත.**

පිටපත්- :

1. ප්‍රධාන ලේකම් - වයඹ පලාත. - කා. දැ.පි.
2. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ටාර් (වයඹ පළාත) - දැ.ගැ.පි - අ.ක.
4. සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි.- අ.ක.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි.- අ.ක.